# ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශවල ඇති ගොවිගම සහ කරාව යන කුල පිළිබඳ අධ්‍යයනයක්

පී.ඒ.පී.කේ. කුමාරි[1], ඩබ්.අයි.ඒ. රත්නසිරි[2]

සිංහල සමාජයේ කුල ක්‍රමය පිළිබඳව විමසා බැලීමේදී උඩරට කුල ක්‍රමයට අමතරව පහතරට කුල ක්‍රමය ඉතා වැදගත් වේ. ගොවිගම කුලයට අමතරව කරාව, සලාගම, දුරාව සහ හුණුකුල යන කුල වර්ග මෙම ප්‍රදේශවල බහුලව දැකගත හැකිය. පහතරට කුල ක්‍රමය පිළිබඳව දළ අවබෝධයක් ලබාගැනීම සහ ප්‍රධාන වශයෙන් පහතරට කුල ධූරාවලියේ ඇති ගොවිගම සහ කරාව යන කුල දෙක අතර නිර්මාණය වී ඇති දුරස්ථභාවය පිළිබඳව විමර්ශනය කිරීම පර්යේෂණයේ මූලික අරමුණ වේ. මෙම පර්යේෂණයට අදාළව ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර නොවන ගවේශණය සහ ක්ෂේත්‍ර ගවේශණය යටතේ තොරතුරු රැස්කළ අතර ඇතැම් කරුණු පිළිබඳව අධ්‍යයනය සඳහා පුස්තකාල ගවේෂණයේ යෙදුණි. ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශවල කුල ක්‍රම ගණනාවක් පැවතුණි. එම කුල ධූරාවලිය තුළ ගොවිගම නම් කුලයට ප්‍රමුඛස්ථානයක් හිමිව ඇති අතර අතීතයේදී කරාව, දුරාව සහ සලාගම යන කුලයන් ද උසස් තත්ත්වයක විසුවන්ගෙන් ප්‍රභවය වූ බවක් සඳහන් වේ.එනම් ක්ෂත්‍රීය සහ බ්‍රාහ්මණ වංශිකයන් ගෙනි. නමුත් 17 වැනි සියවස පමණ වනවිට යුරෝපීය යටත්විජිතකරණයත් සමග සලාගම සහ දුරාව යන කුල අඩු කුල මට්ටමකට කුල ධූරාවලිය තුළ පත් වී ඇත. මෙම කුල දෙකට සාපේක්ෂව කරාව කුලයට එවැනි ඉරණමක් අත් නොවුණ ද එය ගොවිගම කුලයට වඩා අඩු මට්ටමක් හිමි කුලයක් ලෙස සලකනු ලැබේ. මුල් කාලයේදී ගොවි කුලය සමග සම මට්ටමක් පැවති බවට සැලකෙන මෙම කරාව කුලය වර්තමානය වන විට ගොවිගම කුලයට වඩා අඩු කුල මට්ටමකට පත්ව ඇත්තේ විවිධ හේතු සාධක මතය. එනම් විවාහ ක්‍රමය, තම කුලයට දක්වන පක්ෂපාතීත්වය, යුරෝපීය බලපෑම මත ලාංකේය පහතරට ජනයා හට ආරෝපණය කරන ලදි. ආර්ථික ප්‍රතිපත්තිය, යටත්විජිතකරණයේ එක් අරමුණක් ලෙස කරන ලද ආගම් ප්‍රචාරයට අනුව ලාංකේය පහතරට ජනයා බහුල වශයෙන් කිතු දහම වැළඳ ගැනීම සහ මෙහි ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ ප්‍රධාන ආගම අදහන බෞද්ධ ජනයාගෙන් මෙම කිතුදහම වැළඳගත් පහතරට සිංහල ජනයාව හුදකලා කොට තැබීම පෙන්වාදිය හැකිය. ගොවිගම සහ කරාව යන කුල දෙක අතර ඇති මෙම දුරස්ථභාවය යුරෝපීය යටත්විජිත කරණයත් සමඟ ඇති වූ ආගමික හා ආර්ථික රටාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූවක් බව පෙන්වාදිය හැකිය. මෙම කුල දෙක අතරින් ගොවිගම කුලය කෘෂිකර්මාන්තය පදනම් කරගත් දිවි පෙවෙතක් ගත කළ අතර කරාව කුලය ධීවර කර්මාන්තය තම ජීවිකාව කරගෙන ඇත. ධීවර කර්මාන්තය, කෘෂිකර්මාන්තය එකල සමාජ ප්‍රවනතා හා අවශ්‍යතා මත හැඩ ගැසුණු වෘත්තීන් වන අතර වෘත්තිය පදනම් වූ කුල ධූරාවලිය නූතන සමාජයට කෙතරම් ගැලපේ ද යන්න සමාජයක් ලෙස යළි සලකා බැලිය යුතුය.

ප්‍රමුඛ පද : පහතරට, ගොවිගම, කරාව, කුල ක්‍රමය, දුරස්ථභාවය.

---

[1 2] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. prasangikakumari91@gmail.com